අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/12/07/20 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2026.03. 31

චක්‍රලේඛ අංක : **09/2026**

**සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,**
**සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**
**සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**සියලු ම පාසල්වල විදුහල්පතිවරුන් වෙත,**

### පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම (5 සහ 6 ශ්‍රේණි හැර)

පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම (5 සහ 6 ශ්‍රේණි හැර) සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2025.09.09 දිනැති අංක 27/2025 චක්‍රලේඛය සහ අංක ED/09/12/12/07/18 සහ 2025.09.18, 2025.09.24 සහ 2025.10.07 දිනැති උපදෙස් ලිපි අවලංගු කර මෙම චක්‍රලේඛයේ උපදෙස් 5 සහ 6 ශ්‍රේණි හැර, 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමේ දී මින් ඉදිරියට බලපවත්වනු ඇත.

### 2.0 පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව හා ශ්‍රේණියක සමාන්තර පන්ති සංඛ්‍යාව

**2.1** පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල අනුමත ශිෂ්‍ය සංඛ්‍යා පහත සඳහන් පරිදි විය යුතු ය.

(අ) 2 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල එක් පන්තියක සිටිය යුතු අනුමත උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 40ක් වේ.

(ආ) 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල එක් පන්තියක සිටිය යුතු අනුමත උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 45ක් වේ.

ඉහත 2.1 හි සඳහන් අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව ශ්‍රේණියක ඇති සමාන්තර පන්ති සංඛ්‍යාවෙන් ගුණ කිරීමෙන් ශ්‍රේණියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව ගණනය කරනු ලැබේ. පුරප්පාඩු ලෙස සැලකෙන්නේ පුරප්පාඩු කැඳවන දිනට අදාළ ශ්‍රේණියේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව මෙම අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව නො ඉක්මවන්නේ නම් පමණි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත පන්තියක සිටිය යුතු අනුමත උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව සංශෝධනය විය හැක.

**2.2** ශ්‍රේණියක පවත්වා ගත යුතු සමාන්තර පන්ති සංඛ්‍යාව පහත පරිදි විය යුතු ය.

(අ) 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා සෑම ශ්‍රේණියක් සඳහා ම සමාන සමාන්තර පන්ති සංඛ්‍යාවක් පවත්වා ගත යුතු අතර පහත සඳහන් (ආ) අවස්ථාවේ දී හැර, සෙසු සෑම අවස්ථාවක දී ම 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සෑම ශ්‍රේණියක් සඳහා ම සමාන සමාන්තර පන්ති සංඛ්‍යාවක් පවත්වා ගත යුතු ය.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

(ආ) i. ක්‍රීඩා පාසලක් වශයෙන් නම් කර ඇති පාසල්වල පමණක් ක්‍රීඩා කටයුතු සඳහා සුදුසුකම් ලබන සිසුන් වෙනුවෙන් පන්තියක් 8 ශ්‍රේණියේ දී ආරම්භ කළ හැකිය. මේ අයුරින් පන්තියක් ආරම්භ කරන්නේ නම් එම පන්තිය සමඟ ඇති වන සමාන්තර පන්ති සංඛ්‍යාව 11 ශ්‍රේණිය දක්වා පවත්වා ගෙන යා යුතු ය.

ii. ක්‍රීඩා පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේදී මෙම අමාත්‍යාංශය විසින් "ක්‍රීඩා පාසල් සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්වධාරීන් ඇතුළත් කිරීම, පරිපාලනය හා මූල්‍ය කටයුතු" සම්බන්ධයෙන් නිකුත් කර ඇති 24/2020 චක්‍රලේඛයට අනුකූලව සම්මුඛ පරීක්ෂණ පවත්වා නියමිත ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය.

iii. ක්‍රීඩා පාසල්වලට ක්‍රීඩා කුසලතා මත සිසුන් ඇතුළත් කිරීම සඳහා 8 ශ්‍රේණියේ දී ආරම්භ කරන සමාන්තර පන්තිවල පුරප්පාඩු ක්‍රීඩා කුසලතා මත ඇතුළත් වන සිසුන් සඳහා පමණක් වෙන් කළ යුතු ය.

iv. මෙම චක්‍රලේඛයට අනුව සිසුන් ඇතුළත් කිරීම සඳහා පුරප්පාඩු ගණනය කිරීමේදී ක්‍රීඩා පන්තිවල පුරප්පාඩු ඒ සඳහා ඇතුළත් නොකළ යුතු අතර එම පන්තිවල ඉතිරි පුරප්පාඩු 11 ශ්‍රේණිය දක්වා එලෙසම පවත්වා ගත යුතු ය.

v. විශේෂ ක්‍රීඩා දක්ෂතා සහිත සිසුන් 9 ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියකදී ක්‍රීඩා පාසලට ඉල්ලුම් කරන්නේ නම් එම සිසුන් ද ඉහත ක්‍රීඩා පුරප්පාඩු මත පමණක් මෙම පන්තියට ඇතුළත් කළ හැකිය.

(ඇ) ජාතික පාසලක් නම්, මෙම අමාත්‍යාංශයේ ව්‍යුහ කමිටුවේ ද පළාත් පාසලක් නම්, පළාත් ව්‍යුහ කමිටුවේ ද තීරණයක් නොමැතිව පන්ති/ සමාන්තර පන්ති සංඛ්‍යාව වෙනස් නොකළ යුතු ය.

(ඈ) යම් ශ්‍රේණියක් සඳහා සමාන්තර පන්ති පවත්වා ගෙන යාමේදී පන්තියක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව සම්පූර්ණ වන පරිදි අවම සමාන්තර පන්ති සංඛ්‍යාවක් පවත්වා ගත යුතු ය.

(ඉ) පාසලක යම් භෞතික සාධකයක් මත පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු සංඛ්‍යාවක් පවත්වා ගෙන යා යුතු නම් (උදා. පන්ති කාමරයේ ප්‍රමාණය නියමිත පරිමාණයට නොමැති වීම) ඒ සඳහා එම තොරතුරු සනාථ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු ය.

**3.0 5 සහ 6 ශ්‍රේණි හැර, 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීම.**

පාසලක යම් ශ්‍රේණියක පවතින පුරප්පාඩු සඳහා පහත සඳහන් කාණ්ඩවලට අයත් සිසුන් සම්මුඛ පරීක්ෂණ ලකුණු අනුපිළිවෙළ අනුව තෝරා ගත යුතු ය.

❖ මෙම චක්‍රලේඛයේ සඳහන් **පාසල අයත් පෝෂිත ප්‍රදේශය** යනු පාසල පිහිටි පරිපාලන **දිස්ත්‍රික්කය වේ.** යම් පරිපාලන දිස්ත්‍රික් බල ප්‍රදේශ මායිමක යම් පාසලක් පිහිටා ඇති අවස්ථාවක මායිමේ ඇති අනෙක් පරිපාලන දිස්ත්‍රික්කයේ ආසන්නතම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද අදාළ කර ගත හැකිය.

**3.1 සිසුන් ඇතුළත් කිරීමට සලකා බලනු ලබන කාණ්ඩ**

**(අ) පෙර සේවා ස්ථානයේ සිට කි.මී. 25 ට වඩා වැඩි දුරක පිහිටි සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය / සංස්ථා සේවාවල / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය බැංකු නිලධාරීන්ගේ දරුවන්.**

මෙහිදී අයදුම්කරුගේ නව සේවා ස්ථානය හෝ පාසලට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන දරුවා ඇතුළු පවුලේ සාමාජිකයින් පදිංචි ස්ථානය හෝ ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පිහිටා තිබිය යුතු ය.

මේ සඳහා ඉල්ලුම් කළ හැකි වන්නේ නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගත් දින සිට වර්ෂ 03ක කාලයක් තුළ පමණි.

පදිංචිය සනාථ කිරීමට අයදුම්කරුගේ සහ කලත්‍රයාගේ පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කරන ලේඛන, පදිංචිය සනාථ කරන ග්‍රාම නිලධාරි සහතික, ඡන්ද හිමි නාම ලේඛන වැනි පිළිගත හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

**තව ද අයදුම්කරු අවසානයට ලද ස්ථාන මාරුව පමණක් සලකා බැලිය යුතු අතර,** අනුයුක්ත කිරීම්, පුහුණු පාඨමාලා හා අධ්‍යයන කටයුතු සඳහා සේවා ස්ථානය වෙනස් වීම ආදිය මෙම කාණ්ඩය යටතේ සලකා බලනු නො ලැබේ.

ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනට පෙර සිට දරුවා මෙම කාණ්ඩය යටතේ අයදුම් කිරීමට අපේක්ෂා කරන පාසල අයත් අධ්‍යාපන කලාපය තුළ ජාතික පාසලක අධ්‍යාපනය ලබන්නේ නම් මේ සඳහා අයදුම් කළ නොහැකි ය.

**(ආ) ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සඳහා, ශ්‍රී ලංකා දූත මණ්ඩල රාජකාරි සඳහා, ශිෂ්‍යත්ව හෝ අධ්‍යයන කාර්යයක් සඳහා හෝ රැකියා සඳහා දරුවා සමග අඛණ්ඩව වසරකට වැඩි කාලයක් විදේශගත ව සිට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ආසන්න වර්ෂ 03 තුළ දෙමාපියන්/නීත්‍යානුකූල භාරකරු සමග ම දිවයිනට පැමිණ පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි ව සිටින තැනැත්තන්ගේ දරුවන්.**

- ❖ මෙරට පාසලක ඉගෙනුම ලබමින් සිටින අතරතුර විදේශගතව සිට පැමිණි පාසල් සිසුන්ට මෙම කාණ්ඩය යටතේ අයදුම් කළ නො හැකි අතර එම සිසුන් සඳහා විදේශ නිවාඩු සම්බන්ධ ව පවතින චක්‍රලේඛ අනුව කටයුතු කිරීම හෝ අදාළ කලාප අධ්‍යක්ෂ මගින් පූරප්පාඩු සහිත පළාත් පාසලකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. රජයේ අවශ්‍යතා මත විදේශගත වන (විදේශ දූත මණ්ඩල රාජකාරි, අනිවාර්ය වෛද්‍ය පුහුණු, අනිවාර්ය හමුදා පුහුණු හෝ වෙනත් රජයේ අවශ්‍යතා) නිලධාරීන්ගේ දරුවන් සඳහා මෙය අදාළ නොවේ.
- ❖ විදේශගත ව සිටින කාලය තුළ, මසක ට නො අඩු කාලයක් නිවාඩු ලබා මෙරටට පැමිණ නැවත එම රටට ගොස් ඇත්නම්, අඛණ්ඩ කාලයට එය බලපෑමක් නොවන බව සලකන්න.

(ඇ) **ඉල්ලුම් කරන පාසලට කි.මී. 50 කට වඩා වැඩි දුරක දරුවා ඇතුළු පවුලේ සාමාජිකයන් සමග පදිංචිව සිට, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශයට දරුවා ඇතුළු පවුලේ සාමාජිකයන් සමග පදිංචිය වෙනස් කර පැමිණ සිටින තැනැත්තන්ගේ දරුවන්.**

මෙහිදී පදිංචිය වෙනස් කිරීමට හේතු පිළිගත හැකි ලේඛන මගින් සනාථ කළ යුතු ය. (ඒ බව සනාථ කිරීමට අයදුම්කරුගේ සහ කලත්‍රයාගේ පදිංචිය හැර යාමේ සහතික, පෙර සහ නව පදිංචි ස්ථානවල හිමිකම තහවුරු කරන ලේඛන, පෙර සහ නව පදිංචි ස්ථාන සනාථ කරන ග්‍රාම නිලධාරි සහතික, පෙර සහ නව පදිංචි ස්ථානයේ ඡන්ද හිමි නාම ලේඛන වැනි පිළිගත හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.)

මේ සඳහා ඉල්ලුම් කළ හැකි වන්නේ පදිංචිය වෙනස් කර පැමිණි දින සිට වර්ෂ 3 ක කාලයක් තුළ පමණි.

පදිංචිය වෙනස් වන දිනට පෙර සිට දරුවා මෙම කාණ්ඩය යටතේ අයදුම් කිරීමට අපේක්ෂා කරන පාසල අයත් අධ්‍යාපන කලාපය තුළ ජාතික පාසලක අධ්‍යාපනය ලබන්නේ නම් මේ සඳහා අයදුම් කළ නොහැක.

(ඈ) **5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කයේ අදාළ වර්ෂයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණු සීමාව ඉක්මවූ ඉල්ලුම් කරනු ලබන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුල පදිංචි 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන්**

(ඉ) **කාර්ය මණ්ඩල ගණය**

i. **වර්තමාන සේවා ස්ථානයේ අවම සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පිහිටි පාසලක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගේ දරුවන්**

ii. **වර්තමාන සේවා ස්ථානයේ අවම සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පිහිටි කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක, කලාප අධ්‍යාපන කාර්යාලයක, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවක, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයක, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, ගුරු විද්‍යාලයක, ගුරු මධ්‍යස්ථානයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගේ සහ රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි ස්ථිර/පරිවාස සේවයේ නියුතු විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ දරුවන්.**

iii. **වර්තමාන සේවා ස්ථානයේ අවම සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ සේවා ස්ථානය පිහිටි හෝ ඉහත කාණ්ඩවලට අයත් නොවන වෙනත් රාජ්‍ය ආයතනයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගේ දරුවන්.**

### 3.2 ශ්‍රේණියක ඇති වන පුරප්පාඩු පිළිබඳ ව ප්‍රසිද්ධ කිරීම

(අ) පාසල්වල විදුහල්පතිවරුන් විසින් සෑම වර්ෂයක ම ජනවාරි 31 දිනට එක් එක් ශ්‍රේණිවල පවතින පුරප්පාඩු ප්‍රමාණය ගණනය කර, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද, පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ඒ ඒ ශ්‍රේණියේ සමාන්තර පන්ති ගණන, හා පුරප්පාඩු පිළිබඳව විස්තර ලබා දිය යුතු ය.

(ආ) ජාතික පාසල්වල පුරප්පාඩු පිළිබඳ විස්තර මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ද පළාත් පාසල්වල විස්තර අදාළ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල වෙබ් අඩවි මගින් ද ප්‍රසිද්ධ කරනු ලැබේ.

(ඇ) එලෙස පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීමෙන් පසු එක් එක් පාසල් මඟින් තම පාසලේ පුරප්පාඩු පිළිබඳ විස්තර පාසලේ දැන්වීම් පුවරුවේ සහ පාසල් වෙබ් අඩවිවල අයදුම්පත් කැඳවීමට පෙර ප්‍රසිද්ධ කළ යුතු ය.

### 3.3 අයදුම් කිරීමේ කාර්ය පටිපාටිය

(අ) අයදුම්කරුවන් චක්‍රලේඛයේ සඳහන් වන පුරප්පාඩු ගණනය කරන දිනට අයදුම් කරන කාණ්ඩයට අදාළව තම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(ආ) ඉහත 3.1 යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් විසින් මෙම චක්‍රලේඛයේ උප ලේඛන අංක 01ට අනුව සකස් කර ගත් අයදුම්පත් අදාළ පාසල්වල විදුහල්පතිවරුන් වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. එම අයදුම්පත් සමග සිසුවා ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් පිළිබඳ තමන් විසින් ම සහතික කරන ලද, ඉල්ලුම් කරන කාණ්ඩයට අදාළ සියලු ම ලිපි ලේඛනවල පිටපත්, පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කිරීමේ ලේඛන සහ ග්‍රාම නිලධාරි සහතික ද ඒවා සනාථ කිරීම ට දිවුරුම් ප්‍රකාශයක් ද යොමු කළ යුතු ය. අයදුම්පත සමඟ ඉදිරිපත් කරන ලේඛන හැර වෙනත් කිසිදු ලේඛනයක් පසුව භාර ගනු නොලැබේ.

(ඇ) පාසල් ඉල්ලුම් කිරීමේ දී අවම වශයෙන් පුරප්පාඩු සහිත පාසල් 05ක් සඳහා ඉල්ලුම් කිරීම අනිවාර්ය වේ. පාසල් නම් කිරීමේදී සෑම අයදුම්පතකම එම පාසල් ප්‍රමුඛතා අනුපිළිවෙළින් සඳහන් කළ යුතු ය.

(ඈ) කිසියම් පාසලක් සඳහා කාණ්ඩ කිහිපයක් යටතේ ඉල්ලුම් කරන්නේ නම් එක් එක් කාණ්ඩයට වෙන වෙනම අයදුම්පත් අදාළ පාසල වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) අයදුම්පතේ ඉල්ලුම් කරන මාධ්‍යය පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

### 3.4 තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා ලකුණු ලබා දීමේ පටිපාටිය

3.4.1 පාසලට ලැබී ඇති අයදුම්පත් අනුව සුදුසුකම් ලබන සිසුන් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කළ යුතු ය.

3.4.2 පාසලක යම් ශ්‍රේණියක් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇත්නම් එම ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් සිව් ගුණයක් වූ අයදුම්කරුවන් සංඛ්‍යාවක් විදුහල්පති විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ය. මෙම චක්‍රලේඛයේ සඳහන් ලකුණු ක්‍රමවේදයට අනුකූලව පාසල

මගින් තාවකාලිකව ප්‍රදානය කරනු ලබන ලකුණු අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන සංඛ්‍යාව තෝරා ගත යුතු ය.

3.4.3 පාසලට ලැබී ඇති අයදුම්පත් පාසලේ ශ්‍රේණිවල පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වන්නේ නම් සියලු ම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු ය.

3.4.4 ඉහත සම්මුඛ පරීක්ෂණ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පහත අයුරින් පිහිටුවා ගත යුතු ය.

2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට සිසුන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය:

i. පාසලේ විදුහල්පති - (සභාපති)
ii. පාසලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ සහකාර විදුහල්පති - (ලේකම්)
iii. පාසලේ අංශ ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ ගුරු භවතෙකු - (සාමාජික)

මෙහි දී 2 සිට 4 ශ්‍රේණි සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී ඉහත අංක iii හි සඳහන් සාමාජිකයා ප්‍රාථමික අංශ ප්‍රධානි විය යුතු ය. විදුහල්පති විසින් නම් කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අනුමැතිය ලබාගත යුතු ය. අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයෙහි පිටපතක්, ජාතික පාසලක් නම් ජාතික පාසල් අධ්‍යක්ෂ වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද යොමු කළ යුතු ය.

3.4.5 සිසුන් තෝරා ගැනීමට අදාළ සියලු ම සාධක සලකා බලා සුදුසු පරිදි තීරණ ගැනීමට හා ක්‍රියාත්මක කිරීමට මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට බලතල හිමි වේ. එහි දී චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල වන පරිදි තෝරා ගැනීම් කටයුතු සිදු කළ යුතු අතර චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳ විග්‍රහ කර ගැනීම ද, තෝරා ගැනීමේ ගැටලු පිළිබඳ තීරණ ගැනීම ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ වගකීම වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙලෙස ගනු ලබන තීරණ සම්බන්ධව ලිඛිත වාර්තා තබා ගත යුතු ය.

3.4.6 සම්මුඛ පරීක්ෂණයෙන් පසුව අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතා අනුව පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට ඇතුළත් වීමට සුදුසුකම් ලබන සිසුන්ගේ නම් හා ඔවුන් දැනට ඉගනුම ලබන පාසල, ශ්‍රේණිය, අයදුම් කරන කාණ්ඩය සහ සම්මුඛ පරීක්ෂණ ලකුණු සඳහන් ලේඛනයක් සකස් කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් එහි අත්සන් තැබිය යුතු ය. මෙම ලේඛනයට අමතරව සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ සියලු ම සිසුන්ගේ පොරොත්තු ලේඛනයක් ද ලකුණු ප්‍රමුඛතාව අනුව සකස් කළ යුතු ය. මෙහිදී සම ලකුණු ලබා ගත් සිසුන් කිහිප දෙනෙකු සිටින්නේ නම් පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව අනුව එම සිසුන් පෙළ ගස්වා අදාළ ලේඛන පිළියෙල කළ යුතු ය.

3.4.7 එම ලේඛන සියලු ම ජාතික පාසල් මෙම අමාත්‍යාංශයේ ලේකම් වෙත ද පළාත් පාසලක් නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය. අනුමැතියට ඉදිරිපත් කිරීමේදී මෙම චක්‍රලේඛයේ උප ලේඛන අංක 02 ට අනුව අදාළ ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

3.4.8 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙහි සඳහන් ලකුණු ක්‍රමයට අනුකූල වන පරිදි ලකුණු ලබා දීමේ පත්‍රිකා සකස් කර ගත යුතු ය. එම පත්‍රිකාවේ දෙමාපියන්/ නීත්‍යානුකූල භාරකරු ඉදිරියේ එම ලකුණුට එකඟ වන බවටත්, වැරදි තොරතුරු,

ව්‍යාජ ලේඛන ලබා දී ඇති බව තහවුරු වුවහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බව තමන් දැන සිටින බවටත් ඔවුන්ගේ අත්සන් ලබා ගත යුතු අතර එහි පිටපතක් අයදුම්කරුට ලබා දිය යුතු ය. යම් හේතුවක් මත අයදුම්කරුවෙකුට සම්මුඛ පරීක්ෂණයේ දී ලබා දුන් ලකුණු සංශෝධනය වන්නේ නම් අවසන් ලේඛන අනුමැතියට යොමු කිරීමට පෙර ඒ බව අදාළ දෙමාපියන් දැනුවත් කළ යුතු ය.

3.4.9 පාසල්වලට සිසුන් තෝරා ගැනීමට අදාළ ක්‍රියා පටිපාටිය සම්බන්ධ කාල සීමා පහත පරිදි විය යුතු ය.

| | |
|---|---|
| පුරප්පාඩු ගණනය කළ යුතු දිනය | ජනවාරි 31 |
| පුරප්පාඩු ප්‍රසිද්ධ කළ යුතු දිනය | පෙබරවාරි 15 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අනුමත කර ගැනීම | පෙබරවාරි 15 ට පෙර |
| අයදුම්පත් පාසලට යොමු කළ යුතු කාල සීමාව | පෙබරවාරි 16 සිට පෙබරවාරි 28 දින දක්වා |
| සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | මාර්තු 01 සිට මාර්තු 15 දක්වා |
| අවසන් ලේඛන අනුමැතිය සඳහා යොමු කිරීම | මාර්තු 31 දිනට පෙර |

3.4.10. සම්මුඛ පරීක්ෂණ මගින් 2 ශ්‍රේණියේ සිට 4 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවලට සිසු සිසුවියන් තෝරා ගැනීමේ දී මෙම චක්‍රලේඛයේ පහත 3.4.10.1 හා 3.4.10.2 හි දක්වා ඇති කරුණු පමණක් සලකා බැලිය යුතු ය.

ඒ අනුව ඉහත කාණ්ඩ යටතේ අයදුම් කරන 2 ශ්‍රේණිය සිට 4 ශ්‍රේණිය දක්වා සිසුන් සඳහා ලබා දිය හැකි මුළු ලකුණු ප්‍රමාණය 50 ක් වේ.

3.4.10.1 පදිංචි ස්ථානයේ හෝ සේවා ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව

මෙහි දී පදිංචි ස්ථානයේ හෝ සේවා ස්ථානයේ සිට පාසල දක්වා ඇති කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු අතර ඒ සඳහා Google සිතියම (Google Map) මගින් දැක්වෙන කෙටි ම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.

පදිංචි ස්ථානය සහ සේවා ස්ථානය යන දෙකෙන් අයදුම්කරුට වඩා වාසිදායක වන අවස්ථාව සඳහා ලකුණු පිරිනැමිය යුතු ය.

| | |
|---|---|
| කි.මී. 10 ක් ඇතුළත | - ලකුණු 25 |
| කි.මී. 10ට වැඩි කි.මී. 15 දක්වා | - ලකුණු 20 |
| කි.මී. 15ට වැඩි කි.මී. 20 දක්වා | - ලකුණු 15 |
| කි.මී. 20ට වැඩි | - ලකුණු 05 |

**(උපරිම ලකුණු 25)**

**3.4.10.2 ඉහත 3.4.10.1 හි ලකුණු මෙම චක්‍රලේඛයේ සියලු ම කාණ්ඩවලට පොදු වන අතර, එම ලකුණුවලට අමතර ව අයදුම්කරු විසින් ඉල්ලුම් කරන කාණ්ඩයට අදාළ වන කොටසට පමණක් පහත සඳහන් පරිදි ලකුණු ලබා දිය යුතු ය.**

(අ) (a) ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ ස්ථාන මාරු වීමේ ස්වභාවය

i. සේවා අවශ්‍යතාව මත/වාර්ෂික ස්ථාන මාරු -ලකුණු 15
ii. නිලධාරියා ගේ ඉල්ලීම මත - ලකුණු 10

ස්ථාන මාරු වීම් ලැබූ සංවෘත සේවාවල නියුතු නිලධාරීන්ගේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය බැංකු නිලධාරීන්ගේ ස්ථාන මාරු වීමේ ස්වභාවය

i. සේවා අවශ්‍යතාව මත/වාර්ෂික ස්ථාන මාරු -ලකුණු 11
ii. නිලධාරියා ගේ ඉල්ලීම මත -ලකුණු 06

(b) පෙර සේවා ස්ථානය සහ වර්තමාන සේවා ස්ථානය අතර දුර

සේවා ස්ථාන අතර දුර ගණනය කිරීම සඳහා කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු අතර ඒ සඳහා Google සිතියම (Google Map) මගින් දැක්වෙන කෙටි ම පොදු ප්‍රවාහන මාර්ගය අදාළ කර ගත යුතු ය.

| | |
|---|---|
| කි.මී. 145 ට වැඩි | - ලකුණු 10 |
| කි.මී. 115ට වැඩි කි.මී 145 දක්වා | - ලකුණු 08 |
| කි.මී. 85ට වැඩි කි.මී. 115 දක්වා | - ලකුණු 06 |
| කි.මී. 55ට වැඩි කි.මී.85 දක්වා | - ලකුණු 04 |
| කි.මී. 25 සිට කි.මී 55 දක්වා | - ලකුණු 02 |

**(උපරිම ලකුණු 25)**

(ආ) විදේශගතව සිට පැමිණ පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචිව සිටින දෙමාපියන්ගේ/නීත්‍යානුකූල භාරකරුවන්ගේ විදේශගත වීමේ ස්වභාවය

| | |
|---|---|
| ශ්‍රී ලංකා රජයේ සේවා අවශ්‍යතා/ශ්‍රී ලංකා දූත මණ්ඩල/ රජයේ ශිෂ්‍යත්ව | - ලකුණු 25 |
| අධ්‍යයන කාර්යයන් සඳහා පෞද්ගලිකව විදේශගත වීම් | - ලකුණු 20 |
| රැකියාවක් සඳහා | - ලකුණු 15 |

**(උපරිම ලකුණු 25)**

(ඇ) (a) ස්ථිර පදිංචි ස්ථානය වෙනස් වී ඇති අයදුම්කරුවන්ගේ නව පදිංචි ස්ථානයේ සිට පෙර පදිංචි ස්ථානයට ඇති දුර

මෙහි දී පදිංචි ස්ථාන දෙක අතර දුර ගණනය කිරීම සඳහා Google සිතියම (Google Map) අදාළ කර ගත යුතු ය.

| | |
|---|---|
| කි .මී.150 හා ඊට වැඩි නම් | - ලකුණු 15 |
| කි.මී.150ට අඩු කි.මී.100 දක්වා | - ලකුණු 10 |
| කි.මී.100ට අඩු කි.මී.50 දක්වා | - ලකුණු 05 |

(b) නව පදිංචි ස්ථානයේ පදිංචිව සිටි කාලය

| | |
|---|---|
| අවුරුදු 02ට වැඩි අවුරුදු 03 දක්වා | - ලකුණු 10 |
| අවුරුදු 01ට වැඩි අවුරුදු 02 දක්වා | - ලකුණු 06 |
| අවුරුදු 01ට අඩු | - ලකුණු 04 |

**(උපරිම ලකුණු 25)**

(ඇ) 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි වර්ෂයට අදාළව

අයදුම් කරන පාසලේ කඩඉම් ලකුණ හෝ ඊට වැඩි නම් - ලකුණු 25
අයදුම් කරන පාසල අයත් දිස්ත්‍රික්කයේ කඩඉම් ලකුණ හෝ ඊට වැඩි නම් - ලකුණු 20
විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කයේ කඩඉම් ලකුණ හෝ ඊට වැඩි නම් - ලකුණු 15

**(උපරිම ලකුණු 25)**

(ඉ) කාර්ය මණ්ඩල ගණය යටතේ 3.1 (ඉ) හි, i කාණ්ඩයෙන් අයදුම් කරන ලද අයදුම්කරුවන් සඳහා පහත පරිදි ලකුණු ලබා දිය යුතු ය.

i. a) ඉල්ලුම් කරන පාසලේ ම සේවය කරන්නේ නම් - ලකුණු 15
වෙනත් පාසලක සේවය කරන්නේ නම් - ලකුණු 14

b) රාජ්‍ය සේවයේ ස්ථිර සේවා කාලය

| | |
|---|---|
| වසර 08ක් හෝ ඊට වැඩි | - ලකුණු 10 |
| වසර 08ට අඩු වසර 06 දක්වා | - ලකුණු 08 |
| වසර 06ට අඩු වසර 04 දක්වා | - ලකුණු 06 |
| වසර 04ට අඩු වසර 03 දක්වා | - ලකුණු 04 |

කාර්ය මණ්ඩල ගණය යටතේ 3.1 (ඉ) හි ii සහ iii කාණ්ඩවලින් අයදුම් කරන ලද අයදුම්කරුවන් සඳහා පහත පරිදි ලකුණු ලබා දිය යුතු ය.

a) ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පිහිටි කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක, කලාප අධ්‍යාපන කාර්යාලයක, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවක, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයක, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, ගුරු විද්‍යාලයක, ගුරු මධ්‍යස්ථානයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් සහ රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි ස්ථිර/පරිවාස සේවයේ නියුතු විශ්ව විද්‍යාල ආචාර්යවරුන්

-ලකුණු 14

ඉහත කාණ්ඩවලට අයත් නොවන වෙනත් රාජ්‍ය ආයතනයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන් - ලකුණු 10

b) රාජ්‍ය සේවයේ ස්ථිර සේවා කාලය

| | |
|---|---|
| වසර 08ක් හෝ ඊට වැඩි | - ලකුණු 10 |
| වසර 08ට අඩු වසර 06 දක්වා | - ලකුණු 08 |
| වසර 06ට අඩු වසර 04 දක්වා | - ලකුණු 06 |
| වසර 04ට අඩු වසර 03 දක්වා | - ලකුණු 04 |

**(උපරිම ලකුණු 25)**

3.4.11 සම්මුඛ පරීක්ෂණ මඟින් 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසු සිසුවියන් ඇතුළත් කර ගැනීමේ දී ඉහත 3.4.10.1 හා 3.4.10.2 හි කරුණුවලට අමතරව පහත (අ) සිට (ඇ) දක්වා සඳහන් කරුණු ද පදනම් කර ගත යුතු ය.

ඒ අනුව ඉහත කාණ්ඩ යටතේ අයදුම් කරන 7 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් සඳහා ලබා දිය හැකි මුළු ලකුණු ප්‍රමාණය 100 ක් වේ.

(අ) ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ වර්තමාන අධ්‍යාපන ප්‍රගතිය:

| | |
|---|---|
| අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍ය 70% හෝ ඊට වැඩි | -ලකුණු 15 |
| අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍ය 50% -70 % අතර | -ලකුණු 12 |
| අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍ය 40% -50 % අතර | -ලකුණු 08 |
| අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍ය 40%ට අඩු | -ලකුණු 04 |

**(උපරිම ලකුණු 15)**

(ආ) ආසන්න වර්ෂ 05ක් තුළ ක්‍රීඩා/නව නිපයුම්/සෞන්දර්ය/ විෂය සමගාමී/ විෂය බාහිර ක්‍රියාකාරකම්:

**ආසන්න වර්ෂ 05ක් තුළ උපරිම ජයග්‍රහණ 05 ක් පමණක් සලකා බලනු ලැබේ.**

අන්තර්ජාතික ජයග්‍රහණ/සහභාගිත්වය - ලකුණු 25
අන්තර්ජාතික මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා ලකුණු 05 බැගින්/අන්තර්ජාතික මට්ටමේ තරඟ සහභාගිත්වය සඳහා ලකුණු 4.5 බැගින්

සමස්ත ලංකා/ජාතික මට්ටමේ ජයග්‍රහණ - ලකුණු 20
සමස්ත ලංකා/ජාතික මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 04 බැගින්/දෙවන ස්ථානය සඳහා ලකුණු 03 බැගින්/තෙවැනි ස්ථානය සඳහා ලකුණු 2.5 බැගින්

පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 15
පළාත් මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 03 බැගින්/දෙවන ස්ථානය සඳහා ලකුණු 2.5 බැගින්/තෙවැනි ස්ථානය සඳහා ලකුණු 01 බැගින්

කලාප මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 10
කලාප මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 02 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 1.5 බැගින්/තෙවැනි ස්ථානය සඳහා ලකුණු 01 බැගින්

කොට්ඨාස මට්ටමේ ජයග්‍රහණ සඳහා -ලකුණු 7.5
කොට්ඨාස මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 1.5 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 01 බැගින්/තෙවැනි ස්ථානය සඳහා ලකුණු 0.5 බැගින්

පාසල් මට්ටමේ ජයග්‍රහණ සඳහා - ලකුණු 05
පාසල් මට්ටමේ එක් ජයග්‍රහණයක් සඳහා පළමු ස්ථානය සඳහා ලකුණු 01 බැගින්/ දෙවන ස්ථානය සඳහා ලකුණු 0.5 බැගින්/තෙවැනි ස්ථානය සඳහා ලකුණු 0.25 බැගින්

**(උපරිම ලකුණු 25)**

❖ මෙම ලකුණු ප්‍රදානය කිරීමේ දී එක් තරඟ ඉසව්වක් සඳහා ලකුණු ලබා දිය යුත්තේ ඉහළ ම මට්ටම සඳහා පමණි.

**ඉහත තරඟ පෞද්ගලික ආයතනයක් හෝ සංවිධානයක් මගින් සංවිධානය වූවක් නම් එය මෙම අමාත්‍යාංශය හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත වූවක් විය යුතු ය.**

(ඇ) නායකත්ව කුසලතා

| | |
|---|---|
| ශිෂ්‍ය නායක / ක්‍රීඩා නායක | - ලකුණු 06 |
| විෂය සමගාමී ක්‍රියාකාරකම් | - ලකුණු 04 |

**(උපරිම ලකුණු 10)**

❖ නායකත්ව කුසලතා සඳහා ලකුණු ලබා දීමේ දී පාසල්වල සිදු කරන ලද ක්‍රියාකාරකම් සඳහා පමණක් ලකුණු ලබා දිය යුතු ය.

විදේශගත කාණ්ඩය සඳහා ඉහත 3.4.11 යටතේ ලකුණු ලබා දීමේ දී සුදුසු පරිදි සලකා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තීරණ ගත යුතු ය.

**3.5 තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු විශේෂ කරුණු**

(අ) පාසල්වල අදාළ ශ්‍රේණියට අයත් (ද්වි මාධ්‍ය පන්ති ද ඇතුළු ව) සමාන්තර පන්ති සියල්ලෙහි සිටිය යුතු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව නො ඉක්මවන පරිදි තෝරා ගැනීම් සිදු කළ යුතු ය. ද්වි මාධ්‍ය පන්ති සඳහා වෙන ම පුරප්පාඩු ගණනය නො කළ යුතු ය.

(ආ) අතරමැදි ශ්‍රේණි සඳහා පාසල්වලට සිසුන් ඇතුළත් කර ගනු ලබන්නේ සිංහල සහ/දෙමළ මාධ්‍ය සඳහා පමණක් වන අතර ඉංග්‍රීසි මාධ්‍ය සඳහා සිසුන් ඇතුළත් කර ගනු නො ලැබේ. එමෙන්ම සිසුන් තෝරා ගැනීමෙන් අනතුරු ව මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන සියලු ම තොරතුරු ලේඛන මගින් තහවුරු කර ගත යුතු අතර අයදුම් කරන කාණ්ඩය ට අදාළ සියලු ම සුදුසුකම් අදාළ වර්ෂයේ පුරප්පාඩු ගණනය කරන දින වන විට සම්පූර්ණ වී තිබිය යුතු ය. එමෙන්ම, යම් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු/ලේඛන සාවද්‍ය බව තහවුරු වුවහොත් එම අයදුම්පත ප්‍රතික්ෂේප කළ යුතු අතර අදාළ සිසුවා පාසලට තෝරා නො ගත යුතු ය. තෝරා ගෙන ඇත්නම් පාසලට ඇතුළත් කර නො ගත යුතු ය.

අයදුම්කරුවෙකු සාවද්‍ය ලේඛන ඉදිරිපත් කරමින් යම් පාසලකට දරුවන් ඇතුළත් කර ඇති බව එම ඇතුළත් කිරීම සිදු කර මාස තුනක කාලයක් ඇතුළත තහවුරු වන්නේ නම් අයදුම් කරන ලද අනෙකුත් සිසුන් ගේ අයිතිවාසිකම් තහවුරු වන පරිදි එම සිසුවාට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සුදුසු පාසලක් නම් කිරීමෙන් පසු අදාළ පාසලෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු ය.

(ඈ) පාසලේ ශ්‍රේණියක පවතින පුරප්පාඩු ගණනට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් සමාන ලකුණු ලබා තිබේ නම් එම අයදුම්කරුවන්ගේ පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාව අනුව ප්‍රමුඛතා අනුපිළිවෙළින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සිසුන් සංඛ්‍යාවක් පමණක් තෝරා ගැනීමට කටයුතු කළ යුතු ය.

(ඉ) පදිංචිය තහවුරු කරන ලේඛන

මෙහි දී අයදුම්කරු ගේ පදිංචි ස්ථානය ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතු අතර පදිංචි ස්ථානයට ඇති හිමිකම සනාථ කර ගැනීම සඳහා පහත ලේඛන සලකා බැලිය යුතු ය.

- සින්නක්කර ඔප්පු (මේ යටතේ ලකුණු උපයා ගැනීමට නම් අයදුම්කරුගේ/කලත්‍රයා ගේ නමට හෝ අයදුම්කරුගේ/කලත්‍රයා ගේ මවගේ/පියා ගේ නමට පමණක් හිමිකම පැවතිය යුතු ය.)
- අයදුම්කරුගේ/කලත්‍රයාගේ නමට පමණක් ඇති අඛණ්ඩ ව ලියාපදිංචි කරන ලද බදු ඔප්පුව

  (අ), (ආ) සහ (ඇ) කාණ්ඩ යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ගේ ලියාපදිංචි බදු ඔප්පුව අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසන් දින ට පෙර ලියාපදිංචි කර තිබිය යුතු ය.

  (ඈ) සහ (ඉ) කාණ්ඩ යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ගේ ලියාපදිංචි බදු ඔප්පුව අවම වශයෙන් අයදුම් පත් ඉදිරිපත් කළ හැකි අවසන් දිනට වසර 03 කට පෙර ලියාපදිංචි කර තිබිය යුතු ය. බදු ඔප්පුව අයදුම් කරන වර්ෂයේ අදාළ දින සිට ඉදිරි වර්ෂයක කාලයක් සඳහා වලංගු විය යුතු ය.

  - අදාළ දේපළ/ නිවස සඳහා වෙනම වරිපනම් අංකයක්/ ගෘහ අංකයක් තිබිය යුතු අතර අවශ්‍ය වන්නේ නම් බදු දීමනාකරුගේ අයිතිය සම්බන්ධව පත්‍රිරු මඟින් සනාථ කළ යුතු ය.
  - නිල නිවාසවල පදිංචිය තහවුරු කිරීම සඳහා ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද ලිපි (මෙම ලේඛන අයදුම්පත් ඉදිරිපත් කළ හැකි අවසන් දින වන විට නීත්‍යානුකූල වලංගු තත්ත්වයේ පැවතිය යුතු ය.)

(ඊ) සියලු ම කාණ්ඩ යටතේ අයදුම් කරන අයදුම්කරුවන්ගේ පදිංචිය, ස්ථානීය පරීක්ෂණ මඟින් තහවුරු කර ගත යුතු ය. ස්ථානීය පරීක්ෂණයේ දී පදිංචිය තහවුරු නොවේ නම්, ලේඛනවලින් එම නම් ඉවත් කළ යුතු ය.

යම් පුද්ගලයකු පදිංචි බව හෝ පදිංචි නොවන බව පසුකාලීන ව සනාථ කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමට හැකි වන පරිදි ස්ථානීය පරීක්ෂණ පිළිබඳ සියලු තොරතුරු සමඟ වාර්තා සකස් කොට තබා ගත යුතු ය. මෙම වාර්තාවේ ස්ථානීය පරීක්ෂණය කළ දිනය, වේලාව සහ ස්ථානීය පරීක්ෂණය කළ අයගේ නම හා අත්සන, ස්ථානීය පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ දී සිටි නිවැසියන්ගේ තොරතුරු (ජාතික හැඳුනුම්පත් අංක, අත්සන යනාදිය ) අනිවාර්යයෙන් ඇතුළත් කළ යුතු ය.

ස්ථානීය පරීක්ෂණය අවම වශයෙන් අවස්ථා 03ක දී වත් සිදු කළ යුතු අතර පදිංචිය තහවුරු කර ගත හැකි පරිදි ස්ථානීය පරීක්ෂණ සිදු කරන අවස්ථා ගණන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කළ යුතු ය.

3.6 පාසල්වල පුරප්පාඩු මත 11 ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කිරීම පාසල විසින් අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සිසුන්ගේ අයදුම්පත් යොමු කිරීමට පෙර පමණක් සිදු කළ යුතු ය.

3.7 (අ) පාසල්වල එක් එක් ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා සිසුන් තෝරා ගැනීමේ දී චක්‍රලේඛයෙහි ඉහත 3.1 හි සඳහන් කාණ්ඩ යටතේ ප්‍රමාණවත් අයදුම්පත් සංඛ්‍යාවක් පාසලට යොමු වී නොමැති නම්, නියමිත පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීම සඳහා පාසල වෙත ලැබී ඇති අනිකුත් අයදුම්පත් ද සම්මුඛ පරීක්ෂණයට කැඳවිය හැක.

(ආ) එම අයදුම්පත් ප්‍රමාණය පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවන්නේ නම් මෙහි 3.4 ට අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වා සිසුන් තෝරා ගත යුතු ය.

(ඇ) ඉහත 3.7 (අ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් සඳහා ලකුණු ලබා දීමේ දී 3.4.10.1 සහ 3.4.11 හි සඳහන් කරුණුවලට නියමිත ලකුණු පමණක් ලබා දිය යුතු ය.

3.8 නැවත සලකා බැලීම් හා පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීම

3.8.1 යම් අයදුම්කරුවෙකු අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය දීත් තම අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇත්නම් හෝ සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ අසාධාරණයක් සිදු වූ බව හැඟී යන්නේ නම්, තොරතුරු සනාථ කරන කරුණු සඳහන් ඉල්ලීම් ලිපියක් පාසලේ අවසන් ලේඛනය අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිත දිනට පෙර ලැබෙන සේ අයදුම්කරුවන් විසින් පාසලට යොමු කළ හැකිය. අවසන් ලේඛන අනුමැතියට යොමු කිරීමෙන් පසුව ලැබෙන ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

3.8.2 එසේ පාසලට යොමු වන පැමිණිලි සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අවසන් ලේඛන අනුමැතිය සඳහා යොමු කිරීමට පෙර අයදුම්කරුවන් කැඳවා පරීක්ෂා කළ යුතු ය. අයදුම්පත නැවත ප්‍රතික්ෂේප වන්නේ නම් ඒ බව හේතු සහිත ව එම අයදුම්කරුවන් ට දැනුම් දිය යුතු අතර ඒ පිළිබඳ වාර්තා පාසල තුළ පවත්වා ගෙන යා යුතු ය.

3.8.3 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ මෙම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු වන පැමිණිලි/විරෝධතා සම්බන්ධව කටයුතු කිරීමට අවශ්‍ය වන්නේ නම් පමණක් පහත පරිදි මණ්ඩල පත් කළ හැකිය.

i. පළාත් පාසලක නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන ලද නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කටයුතු කළ පාසලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ සහකාර විදුහල්පති - (ලේකම්) සහ පාසලේ අංශ ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ ගුරු භවතෙකු - (සාමාජික).

ii. ජාතික පාසලක නම් මෙම අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරන ලද නිලධාරියෙකු ගේ ප්‍රධානත්වයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කටයුතු කළ පාසලේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ සහකාර විදුහල්පති - (ලේකම්) සහ පාසලේ අංශ ප්‍රධානී/ ජ්‍යෙෂ්ඨ ගුරු භවතෙකු - (සාමාජික).

- ❖ මෙම මණ්ඩලය සඳහා අවශ්‍යතාව පරිදි පළාත් පාසලක නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද ජාතික පාසලක නම් මෙම අමාත්‍යාංශ ලේකම් විසින් ද ඉහත නිලධාරීන්ට අතිරේක ව තවත් නිලධාරීන් නම් කළ හැකිය.

3.8.4 ඉහත නිලධාරි මණ්ඩලය විසින් එසේ යොමු වන පැමිණිලි සම්බන්ධ නිර්දේශ ඇතුළත් වාර්තාව පළාත් පාසලක නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ද ජාතික පාසලක නම් මෙම අමාත්‍යාංශ ලේකම් වෙත ද යොමු කළ යුතු අතර

ඒ සම්බන්ධ අවසන් තීරණය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/මෙම අමාත්‍යාංශ ලේකම් සතු වේ.

## 4.0 පොදු කරුණු

4.1 ස්වාභාවික ව්‍යසනයක් හෝ වෙනත් ආපදාවක් හේතු කොට ගෙන අවතැන් වූ පවුල්වල දරුවන් පාසල්වලට ඇතුළත් කිරීමේ දී උප්පැන්න සහතික, අස්වීමේ සහතික ආදිය නොමැති වූ විට එකී පවුල් ආපදාවට/ස්වාභාවික ව්‍යසනයකට පත් වූ බවට ග්‍රාම නිලධාරි හෝ ප්‍රාදේශීය ලේකම් ගේ තහවුරු කිරීම මත හෝ අදාළ කඳවුර භාර නිලධාරීන්ගේ තහවුරු කිරීම මත සලකා බලා සුදුසු පරිදි කටයුතු කළ යුතු ය. උප්පැන්න සහතික ඉදිරිපත් කළ නො හැකි අවස්ථාවන්හි දී උපන් දිනය සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත හැකි ය. එහෙත්, පසු ව උප්පැන්න සහතිකය/අනුමාන වයස් සහතිකය ලබා ගත යුතු ය.

4.2 රජයේ අනුමත ව්‍යාපෘති යටතේ තමන් පදිංචි නිවස සහිත ඉඩම පවරා ගැනීම හෝ ස්වාභාවික ව්‍යසන ආදිය හේතුවෙන් හෝ ඉගෙනුම ලබන පාසල වෙනස් කිරීමට අයදුම් කිරීමේ දී ඒ බව අදාළ ලේඛන මගින් සනාථ කර ගැනීමෙන් අනතුරු ව සුදුසුකම් පරීක්ෂා කර බලා පුරප්පාඩු අනුව සුදුසු පළාත් පාසල්වලට ඇතුළත් කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතු ය.

4.3 විධිමත් ලෙස පාසල්වලට ඇතුළත් නො වූ පාසල් යා යුතු වයසේ ළමයින් හා නො විධිමත් අධ්‍යාපන වැඩසටහන යටතේ සාක්ෂරතා පන්තිවලට සහභාගී වී සාක්ෂරතා කුසලතා ලැබූ ළමයින් ඔවුන්ගේ වයස හා ප්‍රවීණතාව සලකා සුදුසු පන්තිවලට ඇතුළත් කර ගැනීමට හැකි ය. සාක්ෂරතා පන්තිවලට හෝ වෙනත් පාසලකට නො ගියත් විදුහල්පති ඇතුළු මණ්ඩලයක් මගින් ළමයා සතු දක්ෂතා පරීක්ෂා කර බලා පුරප්පාඩු අනුව ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු ය. එවැනි ශිෂ්‍යයන් සඳහා උප්පැන්න සහතිකය හෝ දිවුරුම් පෙත්සමක් පිළිගත හැකි ය. එහෙත්, පසු ව උප්පැන්න සහතිකයක්/අනුමාන වයස් සහතිකයක් ලබා ගත යුතු ය.

4.4 අනිවාර්ය අධ්‍යාපන නියෝග යටතේ පාසල් වෙත යොමු කරන සිසුන් ඇතුළත් කිරීම සඳහා පළාත් පාසලක නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද ජාතික පාසලක නම් මෙම අමාත්‍යාංශ ලේකම් ගේ ද අනුමැතිය ලබා ගත යුතු ය .

4.5 අංක 1961 අංක 08 දරණ උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) යන පනත් අනුව රජයට පවරා ගන්නා ලද පාසල්වල පුරප්පාඩු පිරවීමේදී පවරා ගන්නා අවස්ථාවේ එම පාසලේ සිටි ආගමික සිසු අනුපාතය ගැන සැලකිලිමත් විය යුතු ය. යම් ආගමක එක් කොටසකට වෙන් කරන ලද ප්‍රමාණයට වඩා අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඇති කල්හි එම පුරප්පාඩු සෙසු ආගමික කොටස් අතර අනුපාතික ව බෙදා හැරිය යුතු ය.

4.6 සෑම සිසුවෙකුට ම අධ්‍යාපනයේ සම අවස්ථා ලබා දීම තහවුරු වන පරිදි ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන්ට ද තමා අධ්‍යාපනය ලබන ශ්‍රේණිය අනුව මෙහි 3.1හි සඳහන් කාණ්ඩ යටතේ හෝ 3.7හි සඳහන් කරුණු යටතේ රජයේ පාසලකට අයදුම් කිරීමේ අවස්ථාව පවතී .

4.7 එම සිසුන්ගේ වයස, සාධන මට්ටම සහ භාෂා හැකියාව රජයේ පාසල්වල නියමිත ශ්‍රේණියේ ඉගෙනුම ලැබීමට ප්‍රමාණවත් ද යන්න පාසල අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෙම චක්‍රලේඛයේ

සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය මගින් එම සිසුන්ට ද රජයේ පාසල් සඳහා ඇතුළත් වීමට අයදුම් කළ හැක.

මෙහි දී සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා ඇති බවට පාසලෙන් කැඳවීම් ලිපි ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට සහභාගි වන අවස්ථාවේ දී මෙම වාර්තාව පාසලට ඉදිරිපත් කළ යුතු වන අතර පාසල් සඳහා අයදුම්පත් යොමු කරන අවස්ථාවේ දී අයදුම්පත සමග යොමු කිරීම අවශ්‍ය නොවේ.

4.8 මෙම චක්‍රලේඛයේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**5.0** යම් සිසුවෙක් පාසලකින් ඉවත් වී වසරක කාලයක් ඇතුළත පිළිගත හැකි හේතුවක් මත නැවත එම පාසලට ම ඇතුළත් වීමට අයදුම් කරන අවස්ථාවක දී (6 ශ්‍රේණිය හැර) අදාළ ශ්‍රේණියේ අනුමත ශිෂ්‍ය සංඛ්‍යා සීමාව තුළ පුරප්පාඩු පවතින්නේ නම් පෙර ඇතුළත් වීමේ අංකය යටතේ නැවත ඇතුළත් කළ හැකි ය. එලෙස සිසුන් ඇතුළත් කිරීමේ දී ජාතික පාසලක් නම් මෙම අමාත්‍යාංශ ලේකම් ගේ ද පළාත් පාසලක නම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ ද අනුමැතිය ලබා ගත යුතු ය. යම් සිසුවෙක් පාසලකින් ඉවත් වී වසරක කාලයක් ඉක්මවා ඇත්නම් නැවත එම පාසලට ම ඇතුළත් වීම සඳහා මෙම චක්‍රලේඛයේ 3.3 හි සඳහන් වන ආකාරයට නැවත අයදුම්පත් යොමු කළ යුතු ය.

**6.0** මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාර ව සිසුන් ඇතුළත් කර ගන්නා අවස්ථාවන් හි දී හැර වෙනත් ඕනෑම අවස්ථාවක දී ඉගෙනුම ලබන පාසල වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් ශිෂ්‍යයාගේ පදිංචි ස්ථානයට ආසන්නතම කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මෙම චක්‍රලේඛයේ 2.1 ට අනුව පාසලේ පවතින පුරප්පාඩු මත පදනම් ව පළාත් පාසලක් ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

**7.0** මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාර ව සිසුන් ඇතුළත් කර ගන්නා අවස්ථාවන් හි දී හැර වෙනත් ඕනෑම අවස්ථාවක දී ඉගෙනුම ලබන පාසල වෙනස් කිරීමට අයදුම් කරන සිසුන් ඇතුළත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු සහිත පාසල් ලේඛනයක් පවත්වාගෙන යාමටත් ඒ අනුව ඉල්ලුම් කරන සිසුන් එම පාසල්වලට ඇතුළත් කිරීමටත් සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතු ය.

**8.0** පාසල්වලට සිසුන් ඇතුළත් කල පසු එම සියළුම සිසුන්ගේ නම් ශිෂ්‍යයින් ඇතුළත් කිරීම, ඉහළ දැමීම හා අස් කර ගැනීම පිළිබඳ ලේඛනයේ (Education C32) සඳහන් කර තිබිය යුතු ය. එම ලේඛනයට නම ඇතුළත් කිරීමකින් තොර ව වෙනත් කිසිදු හේතුවක් මත සිසුන් පාසලට අනුයුක්ත කිරීම සහ රඳවා ගැනීම නො කළ යුතු ය. යම් සුවිශේෂී කරුණක් මත සිසුවෙකු මේ වන විට පාසලකට තාවකාලිකව අනුයුක්ත ව සිටී නම් හෝ මෙම අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නො වැළැක්විය හැකි සුවිශේෂී තත්ත්වයක් මත සිදු කරන අනුයුක්ත කිරීම් පවතී නම් හෝ පමණක් එම සිසුන්ගේ නම් පාසලේ තාවකාලික අනුයුක්ත කිරීමේ ලේඛනයකට ඇතුළත් කළ යුතු ය. පාසල්වල අතරමැදි ශ්‍රේණි සඳහා පුරප්පාඩු ප්‍රසිද්ධ කරන පළමු අවස්ථාවේ දී එම සිසුන් පුරප්පාඩු සහිත පාසල් පහක් සඳහා අයදුම් කර සුදුසුකම් ලබන පාසලකට ඇතුළත් වීමට කටයුතු කළ යුතු ය. තවද, තාවකාලිකව අනුයුක්ත වී සිටින සිසුන්ට රජයේ පාසල් විභාග අයදුම් කිරීමට සහ මෙම අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන සියලු තරඟ සඳහා පාසල නියෝජනය කරමින් ඉදිරිපත් වීමට හැකියාව ඇත්තේ නිත්‍ය පාසලෙන් පමණි.

**9.0** අධිකරණ තීන්දු හා අනෙකුත් නෛතික ක්‍රියාමාර්ගවලට අනුකූල ව සිසුන් ඇතුළත් කිරීමට නියම කෙරෙන අවස්ථාවන්හි දී පමණක් ශිෂ්‍යයාගේ අඛණ්ඩ අධ්‍යාපන

අවස්ථා තහවුරු වන පරිදි අවස්ථානුකූල ව තීරණ ගැනීමේ බලය මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

10.0 සියලු ම රජයේ පාසල්වලට සිසුන් ඇතුළත් කිරීමේ දී පාසල් මූල්‍ය කළමනාකරණය පිළිබඳ ව මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති පාසල් පාදක ගුණාත්මක, ප්‍රමාණාත්මක හා ව්‍යුහාත්මක සංවර්ධනය සඳහා සැලසුම් කරණය හා ප්‍රසම්පාදනය පිළිබඳ චක්‍රලේඛය සහ මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව පමණක් කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

11.0 මෙම චක්‍රලේඛ විධිවිධාන සම්බන්ධයෙන් පැන නගින ඕනෑ ම ගැටලුවක් පිළිබඳ ව අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් :-

1. සියලු ම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්
2. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති
3. විගණකාධිපති
4. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්
5. විභාග කොමසාරිස් ජනරාල්
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
7. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්
8. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්

උප ලේඛන අංක 01

**<u>පාසල්වල 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (5 සහ 6 ශ්‍රේණිය හැර)</u>**
**<u>සිසුන් ඇතුළත් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය</u>**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට ඉදිරිපත් කරන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු අතර එම කරුණු සනාථ කිරීම සඳහා අවශ්‍ය සියලු ම ලේඛනවල අයදුම්කරු විසින් සහතික කරන ලද පිටපත් සහිත ව මෙම අයදුම්පත ඉල්ලුම් කරන පාසලේ විදුහල්පති වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය.

**20..... වර්ෂයේ දී ..................................................................... විද්‍යාලයේ ................ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා අයදුම් පත්‍රය**

**අයදුම් කරන කාණ්ඩය:**

**විදේශගත වීම්/ ස්ථාන මාරු/පදිංචිය වෙනස් වීම/කාර්ය මණ්ඩල (i, ii,iii)/ශිෂ්‍යත්ව පරීක්ෂණ ලකුණු මත .......................................................................................................................**

**01. ශිෂ්‍යයා / ශිෂ්‍යාව පිළිබඳ විස්තර :-**

1.1 සම්පූර්ණ නම : ..............................................................................

(වාසගමට යටින් ඉරක් අඳින්න.)

1.2 මුලකුරු සමඟ නම (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................

(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. උදා - ඩබ්ලිව්. ඒ. සී. ඩී. විජේරත්න)

1.3 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) : ..........................................

(අගට යෙදෙන එක් නමක් පමණක් ලියන්න. (උදා:- W.A.C.D. Wijerathna)

1.4 ස්ත්‍රී/ පුරුෂ භාවය : ..............................................................

1.5 ආගම : ..............................................................................

1.6 ඉගෙනුම් මාධ්‍යය:..........................................................

1.7 උපන්දිනය : අවුරුද්ද ............ මාසය ............ දිනය ............

1.8 20...... ජනවාරි මස 31 දිනට වයස : අවුරුදු............ මාස ............දින ............

1.9 දැනට ඉගෙනුම ලබන පාසල හා ශ්‍රේණිය: ............................................................

**02. අයදුම්කරු පිළිබඳ විස්තර :- (මව/ පියා/නීත්‍යානුකූල භාරකරු)**

2.1 සම්පූර්ණ නම :

.......................................................................................................................

.......................................................................................................................

2.2 මුලකුරු සමඟ නම :

.......................................................................................................................

.......................................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :...................................................................

2.4 ශ්‍රී ලාංකිකයෙක් ද :.............................

2.5 ආගම : ........................................

2.6 ස්ථිර ලිපිනය

........................................................................................................................................

........................................................................................................................................

2.7 දුරකථන අංකය : .....................................

2.8 දැනට පදිංචි ව සිටින දිස්ත්‍රික්කය : .........................................

2.9 දැනට පදිංචි ස්ථානයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ......................................

2.10 දැනට පදිංචි ස්ථානයට අදාළ ග්‍රාම නිලධාරි වසම: .......................... අංකය : .......

2.11 දැනට පදිංචි වී සිටින ස්ථානයේ ලිපිනය:

........................................................................................................................................

........................................................................................................................................

2.12 පදිංචිය වෙනස් කර ඇත්නම් පෙර පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය:

........................................................................................................................................

........................................................................................................................................

**03. ඉල්ලුම් කරන වෙනත් පාසල් : (ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව)**

| අනු අංකය | පාසලේ නම | පාසල් වර්ගය (ජාතික/ පළාත්) |
|---|---|---|
| **01.** | | |
| **02.** | | |
| **03.** | | |
| **04.** | | |
| **05.** | | |
| **06.** | | |

**04.** පහත සඳහන් කොටස්වලින් තමා ඉල්ලුම් කරන ගණයට අදාළ කොටස් පමණක් සම්පූර්ණ කරන්න.

| කරුණු | ලකුණු (කාර්යාලීය ප්‍රයෝජනය සඳහා) |
|---|---|
| **4.1** පෙර සේවා ස්ථානයේ සිට කි.මී. 25 ට වඩා වැඩි දුරක පිහිටි සේවා ස්ථානයකට ස්ථාන මාරුවීම් ලැබූ රාජ්‍ය / සංවෘත සේවාවල / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / රාජ්‍ය බැංකු නිලධාරීන්ගේ දරුවන්ගේ කාණ්ඩය<br><br>4.1.1 අවසානයට ස්ථාන මාරු වීම් ලැබ නව සේවා ස්ථානයේ වැඩ භාර ගත් දිනය: ..............................................................<br>4.1.2 ස්ථාන මාරු වීමට අදාළ ව නව සේවා ස්ථානයේ නම හා ලිපිනය:<br>..........................................................................................................<br>..........................................................................................................<br>..........................................................................................................<br>4.1.3 ස්ථාන මාරු වීමට අදාළ ව පෙර සේවා ස්ථානයේ නම හා ලිපිනය:<br>..................................................................................................<br>..................................................................................................<br>..................................................................................................<br>4.1.4 ස්ථාන මාරු වීමෙන් පසු පදිංචි වූ ස්ථානයේ ලිපිනය<br>..................................................................................................................<br>..................................................................................................................<br><br>4.1.5 පෙර සේවා ස්ථානයේ අඛණ්ඩ සේවා කාලය:<br>........................සිට.......................දක්වා<br>4.1.6 ස්ථාන මාරු වීම් ලැබ අයදුම්පත් ඉදිරිපත් කරන දිනට ගත වූ කාලය:<br>අවුරුදු .............. මාස.......... දින .......<br><br>4.1.7 පෙර සේවා ස්ථානයේ සිට නව සේවා ස්ථානයට ඇති දුර ....................(කෙටි ම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.1.8 ස්ථාන මාරු වීම් ලැබ පදිංචි ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර .................(කෙටි ම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.1.9 ස්ථාන මාරු වීම් ලැබූ සේවා ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර................(කෙටි ම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.1.10 ස්ථාන මාරු වීම් ක්‍රියාත්මක වන දිනට පෙර දරුවා ඉගෙනුම ලැබූ පාසල, පිහිටි කලාපය සහ පළාත් පාසලක්ද? ජාතික පාසලක් ද? යන වග<br>..................................................................................................<br>..................................................................................................<br>.................................................................................................. | |

| | |
|---|---|
| 4.1.10 ස්ථාන මාරු වීමට හේතුව: (සේවා අවශ්‍යතා මත / වාර්ෂික ස්ථාන මාරු / නිලධාරියාගේ ඉල්ලීම මත යන්න සඳහන් කරන්න)<br>.........................................................................................<br>.........................................................................................<br>......................................................................................... | |
| **4.2 දරුවා සමඟ අඛණ්ඩව වසරකට වැඩි කාලයක් විදේශ ගත ව සිට පැමිණි පාසල අයත් පෝෂිත ප්‍රදේශයේ පදිංචි ව සිටින දෙමාපියන්ගේ දරුවන්ගේ කාණ්ඩය**<br><br>4.2.1 විදේශගත ව සිට නැවත දිවයිනට පැමිණි දිනය: ........................<br><br>4.2.2 ළමයා සමඟ අඛණ්ඩ ව විදේශගත ව සිටි කාලය:<br>............. දින සිට ...................දින දක්වා<br><br>4.2.3 විදේශ ගත වූ හේතුව: ....................................................................<br>.........................................................................................<br>.........................................................................................<br><br>4.2.4. පදිංචි ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර:........................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්) | |
| **4.3 කි.මී.50 කට වඩා වැඩි දුරක පදිංචිව සිට, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශයට දරුවා ද ඇතුළුව තම පවුලේ සාමාජිකයන් සමඟ පදිංචිය වෙනස් කර පැමිණ සිටින සිට දෙමාපියන්ගේ දරුවන්ගේ කාණ්ඩය**<br><br>4.3.1 පදිංචිය වෙනස් කිරීමට හේතුව:..............................................................<br><br>4.3.2 පදිංචිය වෙනස් කර නව පදිංචි ස්ථානයට පැමිණි දිනය:......................<br><br>4.3.3 පෙර පදිංචි ස්ථානයේ ලිපිනය: ...........................................................<br>.........................................................................................<br><br>4.3.4 නව පදිංචි ස්ථානයේ ලිපිනය: ..............................................................<br>.........................................................................................<br><br>4.3.5 නව පදිංචි ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර:......................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.3.6 නව පදිංචි ස්ථානයේ සිට පෙර පදිංචි ස්ථානයට ඇති දුර:......................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්) | |

| | |
|---|---|
| 4.3.7 පදිංචිය වෙනස් කරන ලද දිනට පෙර දරුවා ඉගෙනුම ලැබූ පාසල, පිහිටි කලාපය සහ පළාත් පාසලක්ද? ජාතික පාසලක් ද? යන වග<br>..........................................................................................................<br>..........................................................................................................<br>.......................................................................................................... | |
| **4.4 පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව පරීක්ෂණයේ දිස්ත්‍රික් කඩඉම් ලකුණු සීමාව හෝ එම සීමාව ඉක්ම වූ සිසුන් (7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පමණක් අදාළ වේ.)**<br><br>4.41 ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි වර්ෂය ..............................................<br><br>4.4.2 ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි පාසල අයත් දිස්ත්‍රික්කය :...................<br><br>4.4.3 ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ලබා ඇති ලකුණු :...........................................<br><br>4.4.4 පදිංචි ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර :....................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්) | |
| **4.5 කාර්ය මණ්ඩල ගණය**<br><br>i. වර්තමාන සේවා ස්ථානයේ අවම සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පිහිටි පාසලක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගේ දරුවන්<br><br>ii. වර්තමාන සේවා ස්ථානයේ අවම සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ පිහිටි කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයක, කලාප අධ්‍යාපන කාර්යාලයක, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවක, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයක, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ, ජාතික අධ්‍යාපන ආයතනයේ, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක, ගුරු විද්‍යාලයක, ගුරු මධ්‍යස්ථානයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගේ සහ රාජ්‍ය විශ්ව විද්‍යාලයන්හි ස්ථිර/පරිවාස සේවයේ නියුතු විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ දරුවන්.<br><br>iii. වර්තමාන සේවා ස්ථානයේ අවම සේවා කාලය වසර තුනක් සම්පූර්ණ කරන ලද, ඉල්ලුම් කරන පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි හෝ සේවා ස්ථානය පිහිටි හෝ ඉහත කාණ්ඩවලට අයත් නොවන වෙනත් රාජ්‍ය ආයතනයක ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගේ දරුවන් | |

| | |
|---|---|
| 4.5.1 රැකියාව/ තනතුර :......................................................................<br><br>4.5.2 වර්තමාන සේවා ස්ථානයේ නම හා ලිපිනය :..........................................<br>..........................................................................................................<br><br>4.5.3 වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :............................................<br><br>4.5.4 රාජ්‍ය සේවයේ ස්ථිර සේවා කාලය :.......................................................<br><br>4.5.5 පදිංචි ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර:................................<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්)<br><br>4.5.6 වර්තමාන සේවා ස්ථානයේ සිට අයදුම් කරන පාසලට ඇති දුර :...............<br>(කෙටිම පොදු ප්‍රවාහන මාර්ගය අනුව කිලෝමීටරවලින්) | |

**ඉහත එක් එක් කාණ්ඩයට අදාළ කොටසට අමතර ව පහත 4.6 හා 4.7 හි කරුණු 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්තිවලට පමණක් අදාළ වේ.**

| | |
|---|---|
| **4.6 සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය**<br>ශිෂ්‍යයා/ ශිෂ්‍යාවගේ වර්තමාන අධ්‍යාපන ප්‍රගතිය<br>අවසාන වාර පරීක්ෂණයෙන් ලබා ගත් මුළු ලකුණු ප්‍රමාණය :-.........................<br>අවසාන වාර පරීක්ෂණයේ මුළු ලකුණුවල සාමාන්‍යය :- .............................. | |

**4.7 ආසන්න වර්ෂ 05ක් තුළ ක්‍රීඩා/ සෞන්දර්ය/ නව නිපැයුම්/ විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම්**

- **ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| ක්‍රීඩා තරගය | ඒකල/සමූහ | පවත්වන ලද වර්ෂය | අදාළ ආයතනය | ලබා ඇති ජයග්‍රහණ | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|
| | | | | පාසල්/කොට්ඨාස /කලාප/පළාත්/ ජාතික/ අන්තර්ජාතික | 1/2/3/ (අන්තර්ජාතික සහභාගීත්ව) | |
| | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |

- **සෞන්දර්ය සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| සෞන්දර්ය තරගය | ඒකල/සමූහ | පවත්වන ලද වර්ෂය | අදාළ ආයතනය | ලබා ඇති ජයග්‍රහණ | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|---|
| | | | | පාසල්/කොට්ඨාස /කලාප/පළාත්/ ජාතික/ අන්තර්ජාතික | 1/2/3/ (අන්තර්ජාතික සහභාගීත්ව) | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

- **නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| නව නිපැයුම | පවත්වන ලද වර්ෂය | අදාළ ආයතනය | ලබා ඇති ජයග්‍රහණ | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| | | | පාසල්/කොට්ඨාස/ කලාප/පළාත්/ ජාතික/ අන්තර්ජාතික | 1/2/3/ (අන්තර්ජාතික සහභාගීත්වය) | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

- **විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම්**

| ක්‍රියාකාරකම් | වර්ෂය | ලබා ඇති ජයග්‍රහණ (පාසල්/කොට්ඨාස/කලාප/පළාත්/ ජාතික/අන්තර්ජාතික) | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|
| | | | |

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| ▪ **නායකත්ව කුසලතා** | | | |
| අදාළ සංගමය/සමිතිය/ ශිෂ්‍ය නායක/ ක්‍රීඩා නායක/ විෂය සමගාමී ක්‍රියාකාරකම් | තනතුර | වර්ෂය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
| | | | |
| | | | |
| | | | |

**ප්‍රකාශය**

මෙහි ඉහත සඳහන් කරනු ලැබූ තොරතුරු සත්‍ය බවත්, ම විසින් මෙහි සඳහන් කළ ස්ථිර පදිංචිය හා අනෙකුත් තොරතුරු පිළිබඳ සත්‍ය හා නිවැරදි සාක්ෂි ඉදිරිපත් කිරීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. මා විසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය/ කූට බව හෙළි වුවහොත් මාගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබන බවත් මම දනිමි. මාගේ ළමයා පාසලට ඇතුළත් කළ පසු තොරතුරු අසත්‍ය/කූට බව හෙළි වුවහොත් ඔහු/ ඇය පාසලෙන් ඉවත් කර ගෙන පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කෙරෙන එම ප්‍රදේශයේ වෙනත් පාසලකට ඇතුළත් කිරීමට මම එකඟ වෙමි.

............................ ..........................................................

දිනය මවගේ/ පියාගේ/ නීත්‍යානුකූල භාරකරුගේ අත්සන

උප ලේඛන අංක 02

**පාසල් මගින් තෝරා ගන්නා ලද සිසුන් ගේ නාම ලේඛන අනුමැතිය ට යොමු කිරීමේ දී විදුහල්පතිවරුන් විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන**

1. පාසලේ පුරප්පාඩු ප්‍රදර්ශනය කරන ලද දැන්වීම (ශ්‍රේණි සංඛ්‍යාව අනුව පුරප්පාඩු, දැන්වීම ප්‍රදර්ශනය කළ දිනය සහ ස්ථානය, අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය සහ අවසාන දිනය, අයදුම්පතේ ආකෘතිය).

2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනය (සාමාජිකයාගේ නම, තනතුර, හැඳුනුම්පත් අංකය, ආදර්ශ අත්සන).

3. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලද සියලු ම අයදුම්කරුවන්ගේ චක්‍රලේඛයේ 3.4.6 වගන්තිය අනුව සකස් කරන ලද නාම ලේඛනය (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලු ම සාමාජිකයින්ගේ අත්සන් සහිත විය යුතු ය).

4. පුරප්පාඩු සංඛ්‍යාව මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල විසින් තෝරා ගත් සිසුන් ගේ ලකුණු අනුපිළිවෙළින් චක්‍රලේඛයේ 3.4.6 වගන්තිය අනුව සකස් කර විදුහල්පති සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ අත්සන් සහ නිල මුද්‍රා සහිත නාමලේඛනය.

5. පාසලට ලැබෙන සියලු ම අයදුම්පත් සහ ඊට අදාළ ලේඛන සුරක්ෂිත ව තබා ගැනීම විදුහල්පති ගේ වගකීම වේ.